# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය - 2018/2019

## සංගීත පීඨය

## සංගීත අධ්‍යාපන ක්‍රමවේදය හා මනෝවිද්‍යාව

## MUNI 31332

කාලය :- පැ 02

සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

- ❖ **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතලිහකින් (40) සමන්විත වේ.**
- ❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- ❖ **සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ලැබේ.**

---

නිවැරදි හෝ වඩාත්ම සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න. (සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න)

1. මනෝවිද්‍යාව විෂය ආරම්භක අවධියේ අධ්‍යයනය කළේ.

    i. සිත/ ආත්මය පිළිබඳවය
    ii. බුද්ධිය/ ආත්මය පිළිබඳවය
    iii. අධ්‍යාපනය/ බුද්ධිය පිළිබඳවය
    iv. සිත/ ආරය පිළිබඳවය
    v. විඥානය/ අභිප්‍රේරණය පිළිබඳවය

2. අවප්‍රමාණ මනෝවිද්‍යාවෙන් අධ්‍යයනයට භාජනය වන්නේ.

    i. සාමාන්‍ය මිනිසුන්
    ii. අධ්‍යාපනය
    iii. රස වින්දනය
    iv. ගැටලු සහිත අය
    v. සංගීතය,
    පිළිබඳවය

3. ඉගෙනුමට පාදකවන මානසික ක්‍රියාවලියකි.

    i. පරිණතිය
    ii. අවධානය
    iii. අධ්‍යාපන මූලධර්ම
    iv. පරිසරය
    v. උපදේශනය

4. පුද්ගල විවිධත්වය නිසා අවශ්‍යවූ විෂය ක්ෂේත්‍රය,

    i. නවයොවුන් මනෝ විද්‍යාවයි
    ii. අධි මනෝ විද්‍යාවයි
    iii. අධ්‍යාපන මනෝවිද්‍යාවයි
    iv. සංගීත මනෝ විද්‍යාවයි
    v. ළමා සංවර්ධන මනෝ විද්‍යාවයි

5. තෝන්ඩයික්ගේ ප්‍රබෝධක ප්‍රතිචාර න්‍යායට අදාල නීති තුන නම්,

    i. ගායනය, වින්දනය, ඵලය
    ii. සූදානම, අභ්‍යාසය, ඵලය
    iii. වින්දනය, සූදානම, අගැයීම
    iv. සංජානනය, ගායනය, අභ්‍යාසය
    v. යාන්ත්‍රිකත්වය, වින්දනය, සංජානනය

අ.පි.බ.

6. ගැහැණු/ පිරිමි ලෙස අධ්‍යාපනය වෙනස්විය යුතු බව පැවසුවේ,

i. රූසෝ
ii. ෆ්‍රොයිඩ්
iii. ඇරිස්ටෝටල්
iv. කාල් යුං
v. කොහ්ලර්

7. පියාජේගේ බුද්ධි සංවර්ධන න්‍යායට අනුව බුද්ධිය සංවර්ධනය වන්නේ,

i. ආරය හා පරිනතිය මතය
ii. පංචේන්ද්‍රිය හා ලිබිඩෝ ශක්තිය මතය
iii. කායික පරිනතිය හා පරිසර ක්‍රියාකාරකම් මතය
iv. සංයුක්ත චින්තනය හා පංචේන්ද්‍රිය ක්‍රියාකාරීත්වය මතය
v. වියුක්ත චින්තනය හා පරිසරය මතය

8. ෆ්‍රොයිඩ්ගේ පෞරුෂ සංවර්ධන අවස්ථා 5 පිළිවෙලින්,

i. මුඛීය, ගුප්ත, ගුද, ලිඟු, වෘද්ධකාම
ii. ගුප්ත, මුඛීය, ගුද, වෘද්ධකාම, ලිඟු
iii. වෘද්ධකාම, මුඛීය, ගුප්ත, ලිඟු, ගුද
iv. මුඛීය, ගුද, ලිඟු, ගුප්ත, වෘද්ධකාම
v. ගුප්ත, ලිඟු, වෘද්ධකාම, මුඛීය, ගුද

9. ඉලෙක්ට්‍රා සංකීර්ණයෙන් ඉදිරිපත්වූ සම්බන්ධතාව,

i. මව හා පියා අතරය
ii. මව හා පුතා අතරය
iii. මව හා දුව අතරය
iv. පියා හා පුතා අතරය
v. පියා හා දුව අතරය

10. “අධ්‍යාපනය” යන්නට සම්ප්‍රදායික නිර්වචනයකි.

i. දැනුම ලබාදීම
ii. පුද්ගල ශක්තීන් පෝෂණය
iii. ආවේදන ක්ෂේත්‍රය පුළුල් කිරීම
iv. තනිව ඉගෙනීමට පුහුණු කිරීම
v. සමාජ සාධරණත්වය ඇති කිරීම

11. සංගීතය රස වීදීමේදී සිදුවිය යුතු වන්නේ,

i. ජනප්‍රියතාවට ප්‍රතිචාර දැක්වීමයි
ii. රිද්මයට ප්‍රතිචාර දැක්වීමයි
iii. ප්‍රබෝධකයන්ට ප්‍රතිචාර දැක්වීමයි
iv. අවස්ථානුකූලව ප්‍රතිචාර දැක්වීමයි
v. සමාජ ස්තරය අනුව ප්‍රතිචාර දැක්වීමයි

12. ළමයාගේ පෞරුෂය සඳහා නිවසේ බලපෑම අධ්‍යයනය කළ ප්‍රථම දර්ශනිකයා ලෙස සැළකෙන්නේ

i. ඩේ කාර්ටිස්
ii. ප්ලේටෝ
iii. හිපොක්‍රටීස්
iv. එම්පිඩොක්ලීස්
v. ඩිමොක්‍රිටස්

අ.පි.බ.

13. ප්ලේටෝගේ අධ්‍යාපන දර්ශනය යොමුවූයේ,

i. සංගීතඥයන් තැනීමටය
ii. ගණිතඥයන් තැනීමටය
iii. දර්ශනික පාලකයන් තැනීමටය
iv. සුභගයින් තැනීමටය
v. යහපත් පුරවැසියන් තැනීමටය

14. ඉගැන්වීමේ ක්‍රමවේදයක් ලෙස ක්‍රීඩාව අවධාරණය කළේ,

i. ෆ්‍රීබෙල්
ii. වන්ඩිට්
iii. විලියම් ජේම්ස්
iv. තෝන්ඩයික්
v. ඇඩ්ලර්

15. ව්‍යවහාරික සංගීතයේදී, සංගීතයේ කාර්ය භාරය වන්නේ,

i. නිර්මාණයේ පාළු ස්වභාවය අහෝසි කිරීමයි
ii. නිර්මාණයේ අදහස තීව්‍ර කිරීමයි
iii. නිර්මාණය සංගීත රසයෙහි කුළු ගැන්වීමයි
iv. නිර්මාණය තුළ ශාස්ත්‍රීය සංගීතය ආරක්ෂා කර ගැනීමයි
v. නිර්මාණය තුළින් සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමයි

16. ශිල්පීය ගිටාර් වාදකයෙකුගේ ඉදිරිපත් කිරීමක් දුටු නිමල්ට, ගිටාර් වාදනයට ආශාවක් ඇතිවිය. ඔහු ගිටාරය ඉගෙන ගැනීමට ගුරුවරයෙකු ලඟට ගොස් ඉගෙනීම ආරම්භ කළේය. සිම්ප්සන්ගේ මනෝචාලක ක්ෂේත්‍රයට අනුව, ඔහු එම ඉගෙනීම ආරම්භ කළ අවස්ථාව දක්වා පසුකළ පියවරයන් පිළිවෙලින්

i. සූදනම, මාර්ගෝපදේශිත ප්‍රතිචාරය, යාන්ත්‍රිකත්වය
ii. සංජානනය, යාන්ත්‍රිකත්වය, සූදනම
iii. මාර්ගෝපදේශිත ප්‍රතිචාරය, යාන්ත්‍රිකත්වය, සූදනම
iv. සංජානනය, සූදනම, මාර්ගෝපදේශිත ප්‍රතිචාරය
v. සමායෝගය, නිර්මාණය, සංකීර්ණ ප්‍රකාශිත ප්‍රතිචාරය

17. පුද්ගල චර්යා පාලනය පරමාර්ථ කොට ගන්නා මනෝ විද්‍යා විෂය ක්ෂේත්‍රය

i. චර්යා මනෝ විද්‍යාවයි
ii. අධ්‍යාපන මනෝවිද්‍යාවයි
iii. නීති මනෝ විද්‍යාවයි
iv. ව්‍යාපාරක මනෝ විද්‍යාවයි
v. ළමා සංවර්ධන මනෝ විද්‍යාවයි

18. චර්යාවාදීන්ට අනුව ඉගෙනුම

i. බාහිර වෙනස්කමකින් පෙන්විය යුතුය
ii. ලිඛිතව ඉදිරිපත් කළ යුතුය
iii. සංකේතාත්මකව දක්විය යුතුය
iv. වින්දනීය බවට පත්කර ගතයුතුය
v. සමස්තයක් ලෙස ගත යුතුය.

අ.පි.බ.

19. සංගීතයේ එන තාරතාව හැඳිනීමට හැකියාව ලැබෙන බව පියාජේ පැවසුවේ,

i. ඉන්ද්‍රිය චාලක අවධියේය
ii. පූර්ව ක්‍රියාකාරී චින්තන අවධියේය
iii. පූර්ව සංකල්පන අවධියේය
iv. සංයුක්ත චින්තන අවධියේය
v. වියුක්ත චින්තන අවධියේය

20. බුද්ධි පරීක්ෂණයක **නොතිබිය යුතු** ගුනාංගයක් වන්නේ

i. භාෂාව සරළ වීම
ii. පුහුණුවී යන අයට වාසි සහගත නොවීම
iii. සම්මත කළ ප්‍රශ්න තිබීම
iv. විෂය දැනුමකින් තොරව පිළිතුරු දීමට හැකිවීම
v. ව්‍යාකූල බවකින් යුතුවීම

21.සාමාන්‍ය ළමුන්ගෙන් වෙන්කර, පාසල්වල විශේෂ අධ්‍යාපන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතු ළමුන්ගේ බුද්ධිඵලය

i. 100 ට වඩා අඩුවිය යුතුය
ii. 90 ට වඩා අඩුවිය යුතුය
iii. 70 ට වඩා අඩුවිය යුතුය
iv. 50 ට වඩා අඩුවිය යුතුය
v. 30 ට වඩා අඩුවිය යුතුය

22. මතක තබා ගැනීම සඳහා සුදුසු ක්‍රමයක් වන්නේ,

i. දීර්ඝ වේලාවක් එක දිගට පාඩම් කිරීමයි
ii. මූලධර්ම අනාවරණය කර ගනිමින් ඉගෙනීමයි
iii. අධි ඉගෙනුමෙන් බැහැරවීමයි
iv. සියලුදේ සමස්තව ග්‍රහනය කර ගැනීමයි
v. නිශ්ශබ්දව පාඩම් කිරීමයි

23. ඉගෙනීම සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය කුමක්ද?

i. උපස්ථම්භනය ඉගෙනීම දියුණු කරයි.
ii. ඉගෙනීමට ඉගෙනීමෙන් තනිව ඉගෙනගත හැකිය
iii. ඩේල්ගේ කේතුවට අනුව හොඳම ඉගැන්වීම දේශනයයි.
iv. සාපේක්ෂ කල් පවත්නා චර්යා වෙනසක් ඇතිකර ගැනීම ඉගෙනීමයි.
v. යහපත් ස්මෘති ක්‍රියාවලිය ඉගෙනීමට ධනාත්මකව ක්‍රියාකරයි.

24. Id සංස්කාරය ඔස්සේ සංගීත අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක වැදගත් කමක් වන්නේ,

i. විවේකය ඵලදායි කරගැනීම
ii. වින්දන කාර්යයට යොමුවීම
iii. නව යොවුන් වියේ ආශාවන් පාලනය
iv. චිත්තවේග වැඩි දියුණු වීම
v. සමාජ සැරසිල්ලක් ලෙස යොද ගැනීමට හැකිවීම

අ.පි.බ.

25. හින්දුස්තානී සංගීතය හදාරන සිසුවකුට, බටහිර සංගීතයේ එන ස්ටාෆ් මත ස්වර පිහිටුවීම මතක තබා ගැනීමට යොදාගත හැකි ක්‍රමයක් වන්නේ,

i. ශබ්ද නගා කියවීම
ii. සමස්ත හා කොටස් ලෙස ඉගෙනුම
iii. සවිරාම ඉගෙනුම
iv. කෘත්‍රිම ක්‍රමය
v. චිත්තජ මවාගැනීම

26. ඉගෙනුම අභ්‍යන්තරිකව සිදුවන සංකීර්ණ ක්‍රියාවලියක් බව අවධාරණය කළේ

i. මාක්ස්වාදීන්
ii. චර්යාවාදීන්
iii. ස්වභාවවාදීන්
iv. විඥ්ඥාණවාදීන්
v. ගෙස්ටෝල්ට්වාදීන්

27. සංගීතයේ අධ්‍යාපනික වටිනාකම හුවාදැක්වෙනුයේ, සංගීත අධ්‍යාපනය තුළ

i. ප්‍රජානන ක්ෂේත්‍රය ප්‍රබල බැවිනි
ii. ආවේදන ක්ෂේත්‍රය ප්‍රබල බැවිනි
iii. ප්‍රජානන හා මනෝචාලක ක්ෂේත්‍ර ප්‍රබල බැවිනි
iv. ආවේදන හා මනෝචාලක ක්ෂේත්‍ර ප්‍රබල බැවිනි
v. ප්‍රජානන, ආවේදන, මනෝචාලක ක්ෂේත්‍ර තුනම ක්‍රියාත්මක බැවිනි

28. සිංහල සංගීතයේ එන "ග්‍රහ ප්‍රභේද" පාඩම ඉගැන්වීමට ගුරුවරයා උදාහරණ ලෙස අදාල ගීතවල

i. පළමු විභාග 2 පමණක් ගයා පෙන්වීම ප්‍රමාණවත්ය
ii. පළමු පේලිය ගයා පෙන්වීම අත්‍යාවශ්‍යය
iii. 1 හා 2 පේලි ගැයීම අත්‍යාවශ්‍යය
iv. සම්පූර්ණ ගීයතම ගයාපෙන්විය යුතුය
v. ගීතය ගයා පෙන්විය යුතු නැත

29. පර්යේෂණ මනෝ විද්‍යාවේ පියා වූයේ

i. විලියම් ජේම්ස්
ii. වන්ඩ්ට්
iii. වර්තයිමර්
iv. බිනේ
v. කැටේල්

30. ස්මෘති ක්‍රියාවලිය පිළිවෙලින්

i. විඥ්ඥාණය ⟶ උපවිඥ්ඥාණය ⟶ අවිඥ්ඥානය
ii. Id ⟶ Ego ⟶ Super Ego
iii. ඉගෙනීම ⟶ ඉගෙනුම ⟶ ඇගයීම
iv. ප්‍රජානන ⟶ ආවේදන ⟶ මනෝචාලක
v. උද්ග්‍රහණය ⟶ ධාරණය ⟶ ආවර්ජනය

අ.පි.බ.

31. සංගීතයේදී ස්වරඥානය සඳහා වැදගත්ම කාර්යවන්නේ,

i. තාරතාව හැසිරවීමයි
ii. කටහඬ පාලනයයි
iii. ස්වසන අභ්‍යාස සිදුකිරීමයි
iv. සංගීත භාණ්ඩ අළුත්වැඩියා කිරීමයි
v. රිද්ම රටා පුහුණුවයි

32. ළමයෙකු තුළ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය, සාමාජයීය කටයුතු, මිතුරු ඇසුර වැනි ලක්‍ෂණ දක්නට ලැබේ නම්, හොවර් ගාඩ්නර්ට අනුව ඔහු තුළ අනිවාර්යයෙන්ම

i. භාෂාමය බුද්ධිය ඇත
ii. අන්තර් පුද්ගල බුද්ධිය ඇත
iii. සංගීත බුද්ධිය ඇත
iv. අවකාශමය බුද්ධිය ඇත
v. තර්කානුකූල බුද්ධිය ඇත

33. අමතකවීම ප්‍රබලව සිදුවන්නේ,

i. නිදගැනීමෙනි
ii. විඥ්ඥාණයේ ඇති දෑ උපවිඥ්ඥාණයට ගමන්කිරීමෙනි
iii. විවේක ගැනීමෙනි
iv. උපවිඥ්ඥාණයේ ඇති දෑ අවිඥ්ඥාණයට ගමන්කිරීමෙනි
v. සංගීතයට සවන් දීමෙනි

34. වයස අවුරුදු 10 ක් වූ සාමාගේ මානසික වයස අවුරුදු 12 ක් බව හෙළිවිය. ඇගේ බුද්ධිඵලය

i. 1.2 කි
ii. 120 කි
iii. 122 කි
iv. 1200 කි
v. 1222 කි

35. සංගීතයේදී විවාදී ස්වර සහිතව රාගාලාපයක් කරන සිසුවකු බිලූම් වර්ගීකරණය අනුව ප්‍රජානන ක්ෂේත්‍රයේ ළඟාවූ පියවර

i. දැනුම
ii. අවබෝධය
iii. භාවිතය
iv. විශ්ලේෂණය
v. සංස්ලේෂණය

36. ඉවසීම වඩාත්ම පුහුණු කළහැකි සංගීතයට අදාළ සංකල්පයක් වන්නේ

i. භජන් ගීත ගායනය
ii. තාන්ස් ගායනය
iii. තරාණා ගායනය
iv. ආලාප ගායනය
v. සරල ගී ගායනය

අ.පි.බ.

37. 10 වසර සිසුන්ට සංගීතය විෂයට අදාළව නූර්ති ගීත ගායනයක් ඉගැන්වීමේදී භාවිතයට ගතහැකි ඉගැන්වීමේ ක්‍රමය

i. ශ්‍රවණය
ii. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
iii. දේශනය
iv. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
v. රංගනය

38. අධ්‍යාපන ක්‍රියාවලිය තුළ සංගීතය අවධාරණය කළ දෙදෙනෙකු නම්

i. සොක්‍රටීස් - ප්ලේටෝ
ii. ප්ලේටෝ - ගාඩ්නර්
iii. ගාඩ්නර් - සිග්මන්ඩ් ප්‍රොයිඩ්
iv. සිග්මන්ඩ් ප්‍රොයිඩ් - හිපොක්‍රටීස්
v. හිපොක්‍රටීස් - හර්බර්ට්

39. සංගීතය හැදෑරීමට ආරම්භකරන 6 වසරේ සිසුවකුගේ ශ්‍රැති ස්ථානය පිළිබඳ මනෝවිද්‍යාත්මකව සිතන ගුරුවරයකු,

i. ස ස්වරය ශ්‍රැති ස්වරය ලෙස පුහුණු කළ යුතුය
ii. ගුරුවරයාගේ ශ්‍රැතියට සමපාත කළ යුතුය
iii. ඕනෑම ස්වරයක් ශ්‍රැතියට ගැනීමට පුහුණු කළ යුතුය
iv. ශ්‍රැති ස්ථානය පිළිබඳව තීරණය පසුවට කල් දැමිය යුතුය.
v. ළමයාගේ ශ්‍රැති ස්ථානය සොයාගත යුතුය

40. මනස පිළිබඳව මණ්ඩල මතය ඉදිරිපත් කළේ

i. ඇරිස්ටෝටල් ii. සොක්‍රටීස් iii. ජෝන් ලොක් iv. පෙස්ටලොසි v. ස්ටැන්ලි හෝල්

::::::::::::::::::::::::::::::

2021.11.11